# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1822/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 09/12/2024 පැය 1400

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.12.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 155 | 240 | තඹ දඟර 04<br>ප්ලාස්ටික් බැරල් 05<br>ප්ලාස්ටික් බුලි 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ මීතොටමුල්ල ප්‍රදේශයේ සඟවා තිබූ **විදේශීය නිෂ්පාදිත ගිනි අවියක් හා එම පතරොම් ගැබ් 02** ක් සොයාගෙන ඇති අතර වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

සැකකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් අනාවරණය වී නොමැති අතර වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.

2024.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේදී **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන** කතරගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් කතරගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුර.

2024.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සූරියවැව පොලිස් වසමේ ඉදිපදුරුවැව ප්‍රදේශයේදී **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන** සූරියවැව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 43 වයස් වල පසුවන සෙවනගල හා සූරියවැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සූරියවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.

2024.12.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගම්පහ පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 510 ක් හා එම ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 11020/- ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 53 ක් වූ උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.

2024.12.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සෙවනගල පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සෙවනගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 34 ක් වූ සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සෙවනගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. බලපත්‍ර කොන්දෙසි උල්ලංඝණය කරමින් ලොරි රථයකින් ගවයින් ප්‍රවාහනය කල සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුරය කඳවුර.**

2024.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුරය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගලෙන්බිඳුනුවැව පොලිස් වසමේ උපුල්දෙනිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ලොරි රථයකින් ගවයින් ප්‍රවාහනය කල සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගලෙන්බිඳුනුවැව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගලෙන්බිඳුනුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. ගංජා පැල සමඟ සැකකරුවන් හයදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.12.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේ වැටලීම් හයක් සිදු කර **වගා කර තිබූ ගංජා පැල 351140 ක් හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවන් හයදෙනෙකු අත්අඩංගුවට ගෙන** කතරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් සෙල්ලකතරගම, දෙයියන්දර හා කතරගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**